# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1981 අංක 78 දරන ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 1981 දෙසැම්බර් මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 ජනවාරි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : රු. 1.10 යි　　　　තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1981 අංක 78 දරන ශ්‍රී ලංකා ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1981 දෙසැම්බර් මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 39/80

**ශ්‍රී ලංකා ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඒ අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය නිශ්චය කිරීම පිණිස ද, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 36 දරන ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභා පනත ඉවත් කිරීම පිණිස ද ඉහත කී කාරණාවලට සම්බන්ධ හෝ ඒවාට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**කෙටි නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.**

**1.** මේ පනත 1981 අංක 78 දරන ශ්‍රී ලංකා ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතෙහි "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## ශ්‍රී ලංකා ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය පිහිටුවීම

**ශ්‍රී ලංකා ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය පිහිටුවීම.**

2. මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන ශ්‍රී ලංකා ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු අතර 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අධිකාරියේ තත් කාලයේ සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් ඒ අධිකාරිය සමන්විත විය යුතු ය.

**අධිකාරිය සංස්ථාවක් විය යුතු බව.**

3. අධිකාරිය, 2 වන වගන්තියෙන් ඊට පවරන ලද නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද ඒ නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීම ද අධිකාරියට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

**අධිකාරියේ සාමාජිකයෝ.**

4. (1) ස්වභාවික සම්පත්, බලශක්ති හා බලය, විද්‍යාව සහ තාක්ෂණ විද්‍යාව හා සම්බන්ධ කාරණාවල දී පළපුරුද්දක් ලබා ඇති බවට හෝ හැකියාවක් දක්වා ඇති බවට අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් එකොළොස් දෙනකුට නොවැඩි වූ සංඛ්‍යාවකින් අධිකාරිය සමන්විත විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් අධිකාරියේ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු අධිකාරියේ අධ්‍යක්ෂජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(3) මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් අධිකාරියේ යම් සාමාජිකයකු ස්වකීය ධුරය කලින් හිස් කරතහොත් මිස, ස්වකීය පත්වීමේ දින සිට අවුරුදු තුනක කාල

යක් ඒ සෑම සාමාජිකයකු ම ධුරය දැරිය යුතු අතර, තමා ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත් නම් මිස ඒ සෑම සාමාජිකයකු ම නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(4) අධිකාරියේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍ය වෝචිත යයි අමාත්‍යවරයා සලකන්නේ නම්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ඒ සඳහා කිසිදු හේතුවක් නොදක්වා, අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(5) අමාත්‍යවරයා විසින් (4) වන උපවගන්තිය යටතේ නියම යක් කරන ලද්දේ අධිකාරියේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද ඒ සාමාජිකයා විසින් ඒ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දිනයෙහි ස්වකීය ධුරය අත් හැරිය යුතු ය.

(6) අධිකාරියේ යම් සාමාජිකයකු (4) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කිරීම, කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(7) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් අධිකාරියේ යම් සාමාජිකයකුට කවර හෝ වේලාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර ඒ ඉල්ලා අස්වීම පිළිගත් බවට අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලබන තෙක් ඒ ඉල්ලා අස්වීම බලාත්මක නොවිය යුතු ය.

(8) අධිකාරියේ සාමාජිකයකු මිය ගිය හොත් හෝ ඉල්ලා අස් වුවහොත් නැතහොත් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්, එසේ මිය ගිය හෝ ඉල්ලා අස් වූ නැතහොත් ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට සාමාජිකයකු වශයෙන් වෙනත් යම් තැනැත්තකු, (1) වන උපවගන්තියේ විධිවිධාන කෙරෙහි නිසි පරිදි සැලකිලි මත්ව, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු, කලින් ඉල්ලා අස් වුවහොත් හෝ මිය යාමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ ස්වකීය ධුරය හිස් කරතහොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(10) රෝගාතුරවීම, අබලතාව හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා අධිකාරියේ සාමාජිකයකුට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ බව අමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දීම ඒ සාමාජිකයාගේ යුතුකම විය යුතු ය. අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන කෙරෙහි නිසි පරිදි සැලකිලිමත්ව, ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වීමට නුසුදුසුකම්.

5. යම්කිසි තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නම් හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙක් නම් නැතහොත් පසුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වුවහොත් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නොවේ නම් හෝ පුරවැසියකු වීම අවසන් වුවහොත් ; හෝ

(ඇ) සිහිවිකල තැනැත්තකු ලෙස ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම්කිසි නීතියක් යටතේ තීරණය කරනු ලැබ සිටී නම් හෝ විනිශ්චය කරනු ලැබ සිටි නම්: හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් මගින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ සිටියේ නම්

ඒ තැනැත්තා අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් කටයුතු කරගෙන යාමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

අධිකාරියේ මුද්‍රාව.

6. (1) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබ සකසා ගනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් එය වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ මුද්‍රාව, අධිකාරිය විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු භාරයෙහි තිබිය යුතු ය.

(3) අධිකාරියේ අනුමතය ඇතිව සහ අධිකාරියේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර අධිකාරියේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබනු ලබන සාධන පත්‍ර හෝ ලේඛන පිළිබඳ ලේඛනයක් අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම.

7. මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් අධිකාරියේ අරමුදලින් අධිකාරියේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

අධිකාරියේ රැස්වීම් පිළිබඳ කටයුතු.

8. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, අධිකාරියේ රැස්වීම් පිළිබඳව හා ඒ රැස්වීම්වල දී කටයුතු කිරීම පිළිබඳව කාර්ය පටිපාටිය අධිකාරිය විසින් විධිමත් කර ගනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පැමිණ සිටින අධිකාරියේ හැම රැස්වීමක ම, මූලාසනය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දරනු ලැබිය යුතු ය. අධිකාරියේ යම් රැස්වීමකට අධ්‍යක්ෂ ජනරාල්වරයා

පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගන්නා ලද යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(3) අධිකාරියේ යම් රැස්වීමක මූලාසනය දරන තැනැත්තාට, තමාගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

(4) අධිකාරියේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් හය දෙනකු විය යුතු ය.

(5) සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසා ම පමණක් අධිකාරියේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය.

## II වන කොටස

## අධිකාරියේ කාර්ය, කර්තව්‍ය හා බලතල

අධිකාරියේ කාර්ය හා කර්තව්‍ය.

9. අධිකාරියේ කාර්ය හා කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) (i) ශ්‍රී ලංකා ජනතාවගේ ප්‍රයෝජනය පිණිස විද්‍යාව හා තාක්ෂණ විද්‍යාව උපයෝගී කර ගැනීමෙහි ලා ජාතික වශයෙන් ස්වශක්තිය කෙරෙහි විශ්වාසය තැබීම ප්‍රවර්ධනය කිරීම හා දියුණු කිරීම සඳහා වූ ක්‍රියා මාර්ග ;

(ii) ජාතික යහපත සැලසෙන ආකාරයකින් ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය කිරීම හා සම්බන්ධ ප්‍රතිපත්තිය සහ එහි ලා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග ;

(iii) ශ්‍රී ලංකාවේ බලශක්ති සම්පත්වල සමස්ත සංවර්ධනය සඳහා වූ සැළසුම් සහ වැඩ පිළිවෙළවල් මෙන් ම ශ්‍රී ලංකාවේ බලශක්ති අවශ්‍යතාවන්හි සියලු ම අංශ පිළිබඳව වූ ප්‍රතිපත්තිය සහ බලශක්තියෙන් උපරිම ප්‍රයෝජන ගැනීම හා එය සංරක්ෂණය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග ;

(iv) විද්‍යා ප්‍රතිපත්තියක් සකස් කොට ක්‍රියාත්මක කිරීම සහ එය සමාලෝචනය කිරීම ;

(v) තාක්ෂණ විද්‍යා ප්‍රතිපත්තියක් සකස් කොට ක්‍රියාත්මක කිරීම සහ එය සමාලෝචනය කිරීම :

(vi) ස්වභාවික සම්පත් සහ බලශක්තිය ප්‍රයෝජනයට ගැනීමට සහ සංවර්ධනය කිරීමට අදාළ සැළසුම් සහ වැඩ පිළිවෙලවල් පාලනය කිරීම, කළමනාකරණය කිරීම හා මෙහෙයවීම සහ සම්බන්ධිත හා අදාළ ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා සහ රජයෙන් මුදල් ආධාර නොලබන්නා වූ ද, ශ්‍රී ලංකාවේ බලාත්මක වන යම් නීතියක් යටතේ, අවස්ථාවෝචිත පරිදි, ලියාපදිංචි කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු ලැබුවා වූ ද මණ්ඩලයක් වන වෙනත් යම් පුද්ගල මණ්ඩලයක් මගින් විද්‍යාව සහ තාක්ෂණ විද්‍යාව ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම පිණිස යොදා ගැනීම සහ උපයෝගී කර ගැනීම ;

(vii) ස්වභාවික සම්පත් හා බලශක්ති සම්පත් සංවර්ධනය කිරීම සඳහා ද විද්‍යාත්මක හා තාක්ෂණික පර්යේෂණ පැවැත්වීම සඳහා ද අරමුදල් වෙන් කිරීම ; සහ

(viii) අමාත්‍යවරයා විසින් අධිකාරිය වෙත යොමු කරනු ලැබිය හැකි වෙනත් යම් කාරණයක්

සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ආ) ස්වභාවික සම්පත් සම්බන්ධයෙන් සහ ඒ සම්පත් ක්‍රමවත් ලෙස සහ එක සමානව ප්‍රයෝජනයට ගැනීම සහ සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ද, බලශක්ති සම්පත් ප්‍රයෝජනයට ගැනීම සහ පාවිච්චි කිරීම සහ බලශක්තිය සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් සහ විද්‍යාත්මක හා කාර්මික කරුණුවලට අදාළ යම් අංශයක් සම්බන්ධයෙන් ද තොරතුරු එක් රැස් කිරීම සහ ප්‍රචාරය කිරීම, වාර්තා, වාර සඟරා සහ ලියවිලි ප්‍රකාශයට පත් කිරීම හා ඒ කාරණා පිළිබඳව මහජනයාට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනයක් ලබා දීම ;

(ඇ) ස්වභාවික සම්පත් සංවර්ධනය කිරීමට අදාළ කාරණා සම්බන්ධයෙන් ද බලශක්තිය සංරක්ෂණය කිරීමට සහ සංවර්ධනය කිරීමට අදාළ කාරණා සම්බන්ධයෙන් ද විද්‍යාව සහ තාක්ෂණ විද්‍යාව පිළිබඳව වූ කාරණා සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකාවෙහි සහ වෙනත් රටවල පුද්ගලයන්, සංගම් හෝ ආයතන සමඟ සම්බන්ධතා ඇති කර ගැනීම සහ පවත්වා ගෙන යාම ;

(ඈ) පහත දැක්වෙන කරුණු, එනම් :—

(i) ශ්‍රී ලංකාවෙහි සිටින විද්‍යාත්මක සහ තාක්ෂණික පිරිස් ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම ;

(ii) ශ්‍රී ලංකාවේ විද්‍යා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යාත්මක සහ තාක්ෂණික මිනිස් බල පිළිබඳ අනාගත අවශ්‍යතා ; සහ

(iii) විද්‍යාත්මක සහ තාක්ෂණික මිනිස් බල පිළිබඳ අනාගත අවශ්‍යතා සපුරාලීම පිණිස ප්‍රමාණවත් පුහුණු කිරීමේ පහසුකම් සැලසීම සඳහා ගත යුතු පියවර

පිළිබඳව අධ්‍යයනය කොට වාර්තා කිරීම;

(ඉ) ශ්‍රී ලංකාවෙහි විද්‍යාත්මක, තාක්ෂණික, අධ්‍යාපනික, සමාජ විද්‍යාත්මක සහ ආර්ථික කාරණා හා සම්බන්ධ ජාතික වැදගත් කමකින් යුත් විෂයයන් සැලකිල්ලට ගෙන ඒවා පිළිබඳව වාර්තා කිරීම;

(ඊ) (i) ශ්‍රී ලංකාවේ සම්පත් සංවර්ධනය කිරීම;

(ii) ශ්‍රී ලංකා ජනතාවගේ සුභ සිද්ධිය ප්‍රවර්ධනය කිරීම; සහ

(iii) පොදුවේ විද්‍යාව සහ තාක්ෂණික විද්‍යාව ශ්‍රී ලංකාවෙහි වැඩි දියුණු කිරීම

යන අරමුණු ඇතිව විද්‍යාත්මක හා තාක්ෂණික පර්යේෂණ ආරම්භ කිරීම, ඒවාට අනුබල දීම සහ ආධාර දීම; සහ

(උ) විද්‍යාව හා තාක්ෂණික විද්‍යාව ශ්‍රී ලංකාවෙහි වැඩි දියුණු කිරීමෙහි ලා අවශ්‍ය වෙනත් දේ කිරීම.

අධිකාරියේ බලතල.

10. අධිකාරියේ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන හෝ අවස්ථානුකූල වන යම් බලතල, අයිතිවාසිකම් සහ අධිකාර, අධිකාරියට තිබිය යුතු අතර, විශේෂයෙන් ම—

(අ) ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම සහ සංවර්ධනය කිරීම හා සම්බන්ධ කවර හෝ අංශයක් පිළිබඳව පර්යේෂණ සමීක්ෂණ හා විමර්ශන ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම, පැවැත්වීම සහ සම්බන්ධීකරණය කිරීම;

(ආ) බලශක්ති සම්පත් පිළිබඳව ගවේෂණ කිරීම, බලශක්ති සම්පත් පාවිච්චි කිරීම සහ සංවර්ධනය කිරීම හා සම්බන්ධ කවර හෝ අංශයක් පිළිබඳව පර්යේෂණ සමීක්ෂණ හා විමර්ශන ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම, පැවැත්වීම සහ සම්බන්ධීකරණය කිරීම;

(ඇ) පර්යේෂණ පහසුකම් ඇති කිරීම පිණිස ගොඩනැගිලි හා රසායනාගාර ඉදි කිරීම, ඒවා උපකරණවලින් සමන්විත කිරීම සහ පවත්වාගෙන යාම හෝ වෙනත් යම් තැනැත්තකු සමඟ එක්ව හෝ තනිව ම හෝ යම් පර්යේෂණ වැඩ සටහනක් ආරම්භ කිරීම;

(ඈ) ස්වභාවික සම්පත් හා බලශක්ති සම්පත් පිළිබඳව ගවේෂණ කිරීම, ඒවා පාවිච්චි කිරීම සහ සංවර්ධනය කිරීම හා සම්බන්ධ කටයුතු සඳහා සහ විද්‍යාව හා තාක්ෂණ විද්‍යාව හා සම්බන්ධ කටයුතු සඳහා පර්යේෂණ අධිශිෂ්‍යත්ව, සහාය ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ත්‍යාග සහ පදක්කම් ඇති කිරීම සහ ප්‍රදානය කිරීම; මේ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ අරමුදලක් හෝ අරමුදල් පිහිටුවීම සහ කළමනාකරණය කිරීම;

(ඉ) යම් විශේෂ පර්යේෂණ යෝජනා ක්‍රමයක් හෝ යෝජනා ක්‍රම හෝ ආරම්භ කිරීම සඳහා නැතහොත් කරගෙන යාම සඳහා යම් විද්‍යාඥයකුට හෝ තාක්ෂණ විද්‍යාඥයකුට හෝ එවැනි තැනැත්තන් කණ්ඩායමකට හෝ යම් පර්යේෂණ ආයතනයකට හෝ යම් විශ්ව විද්‍යාලයකට හෝ යම් පිළිගත් විද්‍යා මණ්ඩලයකට හෝ ප්‍රතිපාදන සැලසීම ;

(ඊ) විද්‍යාත්මක සහ තාක්ෂණික ලේඛන සම්පාදක මධ්‍යස්ථානයක් පිහිටුවා පවත්වා ගෙන යාම ;

(උ) මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් අධිකාරිය සතු විය හැකි යම් චංචල හෝ නිශ්චල දේපලක් භාර ගැනීම හා දැරීම සහ අධිකාරියේ රීතිවලට යටත්ව, ඒ දේපළ විකිණීම, උකස් කිරීම, බදු දීම, ප්‍රදානය කිරීම, හිමිකර දීම, අන්තිම කැමති පත්‍රයකින් බැහැර කිරීම, පැවරීම, හුවමාරු කිරීම නැතහොත් අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඌ) අධිකාරියේ කර්තව්‍ය කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි යම් සේවා නියුක්තයන් හෝ අනුයෝජිතයන් පත් කිරීම සහ ඒ සේවා නියුක්තයන්ට හා අනුයෝජිතයන්ට ගෙවීමට සිදු විය හැකි යම් පාරිශ්‍රමික නිශ්චය කිරීම ;

(එ) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම හා සම්බන්ධව රීති සෑදීම ;

(ඒ) අධිකාරිය විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් අධිකාරියේ මුදල් ආයෝජනය කිරීම ;

(ඔ) අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, අධිකාරියේ කටයුතුවල කවර හෝ අංශයක, අධිකාරියට සහායවීම පිණිස කෘත්‍යාධිකාරී කමිටු පිහිටුවීම, ඒ කමිටුවල කාර්ය පථය සහ අධිකාරය නිශ්චය කිරීම හා අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, ඒ කමිටුවලට තැනැත්තන් පත් කිරීම ; සහ

(ඕ) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමට ආනුෂංගික හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන හෝ ඒ හා සම්බන්ධ හෝ වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම

අධිකාරිය විසින් කළ හැකි ය.

**අධිකාරිය අමාත්‍යවරයාගේ විධාන අනුව ක්‍රියා කළ යුතු බව.**

**11.** අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී අමාත්‍යවරයා අවශ්‍ය යයි සලකන ලියවිල්ලකින් වූ යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින්, අධිකාරිය විමසා හෝ නොඑසේව, අධිකාරියට නිකුත් කළ හැකි අතර අධිකාරිය ඒ විධාන අනුව ක්‍රියා කළ යුතු ය.

## III වන කොටස

## අධිකාරියේ කාර්ය මණ්ඩලය

අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

12. (1) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(2) අධිකාරියේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව, අධිකාරියේ කටයුතු මෙහෙයවීම, එහි බලතල, කර්තව්‍ය හා කාර්ය සංවිධානය කිරීම හා ක්‍රියාවෙහි යෙදවීම සහ අධිකාරියේ සේවා නියුක්තයන් පරිපාලනය කිරීම හා පාලනය කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයාට පැවරෙන්නේ ය.

(3) අධ්‍යක්ෂ ජනරාල් ධුරයෙහි යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, නැතහොත් නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම හෝ වෙනත් හේතුවක් නිසා අධ්‍යක්ෂ ජනරාල්වරයාට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වුවහොත්, අධිකාරිය විසින් හැකි ඉක්මණින් සහ අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල් ධුරයෙහි කාර්ය ඉටු කිරීමට වෙනත් තැනැත්තකු පත් කළ යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලය පත් කිරීම ආදිය.

13. (1) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, අධිකාරිය විසින් —

(අ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය සලකන යම් කාර්ය මණ්ඩලයක් පත් කිරීම, එය සේවයෙන් පහ කිරීම සහ ඒ කාර්ය මණ්ඩලය විෂයයෙහි විනය පාලනය කිරීම ;

(ආ) ඒ කාර්ය මණ්ඩලයේ වැටුප් හෝ වේතන නැතහොත් වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියම හා කොන්දේසි නිශ්චය කිරීම ; සහ

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථ සාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම

කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් කාරණා සියල්ල ම හෝ ඉන් යම් කාරණයක් හෝ සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, අධිකාරියේ කාර්ය මණ්ඩලයට අධිකාරිය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා, තාවකාලිකව පත් කිරීම නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීම කරනු ලැබිය හැකි ය.

(4) රජයේ සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩල යට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රජයේ සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩල යට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) යම් නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියට කරනු ලබන යම් සේවා කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ඔහු විසින් ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) අධිකාරියේ ඉල්ලීම පිට පළාත් පාලන සේවයේ යම් සාමාජික යකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු අවස්ථාවෝචිත පරිදි ඒ සාමාජිකයාගේ, නිලධරයා ගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩල යේ හෝ ඒ පළාත් පාලන ආයතනයේ හෝ කැමැත්ත ඇතිව අධි කාරියේ කාර්ය මණ්ඩලයට අධිකාරිය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව, අවස් ථාවෝචිත පරිදි අධිකාරිය හා පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ ඒ පළාත් පාලන ආයතනය එකඟ වන, විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ද ඇතුළු යම් නියම හා කොන්දේසි මත ඒ සාමාජිකයා, නිලධරයා හෝ සේවකයා අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(8) (7) වන උපවගන්තියේ විධිවිධාන අනුව යම් තැනැත්තකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස් ථාවක ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා ද යටත් විය යුතු ය.

## IV වන කොටස

### මුදල්

**14.** (1) අධිකාරියට අධිකාරියේ ම අරමුදලක් විය යුතු ය. අධිකාරියේ අරමුදල.

(2) (අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා අධිකාරියට ලැබිය හැකි සියලු මුදල් ;

(ඇ) කවර හෝ ප්‍රභවයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් අධිකාරියට ලැබිය හැකි සියලු මුදල්; සහ

(ඈ) අධිකාරියේ බැරට උපචිත වන්නා වූ සියලු මුදල් අධිකාරියේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීමේ දී සහ අධිකාරියේ ව්‍යාපාර කටයුතු කිරීමේ දී ද, අධිකාරියේ සාමාජිකයන්ට සහ අධිකාරියේ සේවා නියුක්තයන්ට පාරිශ්‍රමික ගෙවීමේ දී ද මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් හෝ යටතේ අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමෙහි දී ද අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් පියවීමේ කාර්යය සඳහා සහ අධිකාරිය විසින් කලින් කල බලය දෙනු ලබන වෙනත් යම් කාර්ය සඳහා අධිකාරියේ අරමුදල් අධිකාරිය විසින් උපයෝගී කර ගනු ලැබිය හැකි ය.

අධිකාරියේ ණයට ගැනීමේ බලතල.

15. මේ පනත යටතේ වූ ස්වකීය කාර්ය ඉටු කිරීමෙහි ලා අධිකාරිය විසින් එළඹ ඇති බැඳීම් ඉටු කිරීම පිණිස අධිකාරියට අවශ්‍ය විය හැකි යම් මුදල්, අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව හෝ අමාත්‍යවරයා විසින් දෙන ලද යම් පොදු බලයක නියමයන්ට අනුකූලව අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් තාවකාලිකව ණයට ගනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මේ වගන්තිය යටතේ අධිකාරිය විසින් ලබා ගන්නා ලද යම් තාවකාලික ණය මුදල්වලින් ගෙවීමට ඇති ප්‍රමාණවල මුළු එකතුව, කිසිම අවස්ථාවක මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් මුදලක් නො ඉක්මවිය යුතු ය.

අධිකාරියේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

16. (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) අධිකාරියේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව අධිකාරිය විසින් නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම හා සම්බන්ධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## V වන කොටස

## පොදු විධිවිධාන

බලතල, කාර්ය හා කර්තව්‍ය පැවරීම.

17. (1) මේ පනත යටතේ වූ ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය කිසිවක් අධිකාරිය විසින්, නියමයක් මගින් ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට, රාජ්‍ය සංස්ථාවකට හෝ පළාත් පාලන ආයතනයකට නැතහොත් අධිකාරිය විසින් පිහිටුවනු ලැබූ යම් කාර්‍යාධිකාරී කමිටුවකට පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් අධිකාරිය විසින් ඕනෑම වේලාවක ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය; නැතහොත් වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක්—

(අ) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් සම්බන්ධයෙන් වන විට, ඒ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මිස;

(ආ) යම් රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට, ඒ රාජ්‍ය සංස්ථාව භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මිස;

(ඇ) යම් පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් වන විට, පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මිස

අධිකාරිය විසින් කරනු නොලැබිය යුතු ය.

18. අධිකාරියේ සියලු සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

*අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.*

19. අල්ලස් පනතේ අර්ථානුකූලව, අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ නිරූපණය කරනු ලැබිය යුතු ය.

*අල්ලස් පනතේ අර්ථානුකූලව අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.*

20. (1) (අ) මේ පනත යටතේ අධිකාරිය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව ;

(ආ) මේ පනත යටතේ හෝ අධිකාරියේ මෙහෙයවීම පිට හෝ අධිකාරියේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

*මේ පනත යටතේ හෝ අධිකාරියේ මෙහෙයවීම පිට කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.*

(2) අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියෙහි පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරියට ගෙවන ලද හෝ අධිකාරිය විසින් අයකර ගන්නා ලද යම් ගාස්තු අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ මෙහෙය වීම පිට හෝ කරන ලද නැතහොත් කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියෙහි ඔහුට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය තීරණය කරතහොත්, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගන්නා ලද්දේ නම් මිස, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරියේ සාමාජිකයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

21. අධිකාරියට විරුද්ධව පවරන ලද කවර හෝ නඩුවක දී අධිකාරියේ සාමාජිකයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

රීති සෑදීමට අධිකාරියට ඇති බලය.

22. (1) මේ පනතින් රීති සෑදීමට බලය දී ඇති හෝ නියම කර ඇති සියලු කාරණා සම්බන්ධයෙන් හෝ ඉන් යම්කිසි කාරණයක් සම්බන්ධයෙන් හෝ අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ අධිකාරිය විසින් සාදන ලද කිසිම රීතියක් එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

23. (1) අධිකාරියේ කටයුතුවල කාර්යය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍ය වන්නාවූ ද ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් යෝජිත අත් කර ගැනීම අනුමත කරන්නාවූ ද අවස්ථාවක, ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ දේපළ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත් කර ගනු ලැබ අධිකාරිය වෙත පවරනු ලැබිය හැකි ය.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අධිකාරිය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලක් අධිකාරිය විසින් ගෙවනු ලැබිය යුතු ය.

චංචල හා නිශ්චල යන දෙවර්ගයේම රජයේ දේපළ අධිකාරියට ලබා ගත හැකිවීමට සැලැස්වීම.

24. (1) රජයේ යම් නිශ්චල දේපළක් අධිකාරියේ යම් කටයුත්තක කාර්යය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය, රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ පිළිබඳ විශේෂ ප්‍රදානයක් කළ හැකි හෝ ඒ දේපළ බද්දට දිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, අධිකාරිය වෙත ඒ දේපළ පිළිබඳව කරනු ලබන විශේෂ ප්‍රදානයකට හෝ දෙනු ලබන බද්දකට ඒ ආඥාපනතේ විධිවිධාන, අදාළ විය යුතු ය.

(2) රජයේ යම් චංචල දේපළක් අධිකාරියේ කාර්යය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, ඒ චංචල දේපළෙහි සන්තකය සහ පාවිච්චිය අධිකාරිය වෙත පවරා සතු කර දෙනු ලැබිය හැකි ය.

වාර වාර්තා සහ තොරතුරු.

25. (1) මේ පනතේ 9 වන සහ 10 වන වගන්ති යටතේ වූ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට අධිකාරියට හැකිවනු පිණිස, අධිකාරිය විසින් හෝ අධිකාරිය විසින් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ නිශ්චිත සියලු වාර වාර්තා හෝ තොරතුරු, ඒ දැන්වීමේ නිශ්චිත කාල සීමාවක් ඇතුළත, අධිකාරිය වෙත හෝ එසේ බලය දෙනු ලැබූ තැනැත්තා වෙත හෝ සපයන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) යම් වාර වාර්තාවක් හෝ තොරතුරු සපයන ලෙස (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් යම් තැනැත්තකුට නියම කරනු ලැබූ විට, යම් නීතියක විධිවිධාන යටතේ, ඒ වාර වාර්තාව සැපයීමෙන් හෝ ඒ තොරතුරු හෙළිදරව් කිරීමෙන් ඒ තැනැත්තා වැළැක්වෙන අවස්ථාවක හැර, ඒ දැන්වීමේ නිශ්චිත කාලය ඇතුළත, ඒ නියමය අනුව ක්‍රියා කිරීම, ඒ තැනැත්තාගේ යුතුකම වන්නේ ය.

යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළුවීමට ඇති බලය.

26. යම් ඉඩමක හෝ පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත යටත් පිරිසෙයින් දින දාහතරක ලියවිල්ලකින් වූ දැනුම් දීමක් කිරීමෙන් පසු, අධිකාරිය විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ අධිකාරියේ යම් නිලධරයකුට හෝ සේවකයකුට, එකී ඉඩමට හෝ පරිශ්‍රයට ඇතුළුවීම ද, එහි දී අධිකාරියේ යම් කටයුත්තක් කර ගෙන යාමේ කාර්යය සඳහා හෝ අධිකාරියේ යම් බලයක් ක්‍රියාත්මක කිරීමට හෝ යම් කර්තව්‍යයක් ඉටු කිරීමට පූර්වයෙන් වූ හෝ එහි ලා ආනුෂංගික වූ යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් සඳහා යුක්තිසහගත ලෙස අවශ්‍ය විය හැකි යම් ක්‍රියා කිරීම ද කළ හැකි ය.

වැරදි සහ දණ්ඩන.

27. (1) (අ) මේ පනත යටතේ හෝ මේ පනතේ කාර්ය සඳහා සාදන ලද හෝ සපයන ලද යම් වාර වාර්තාවක හෝ වෙනත් ලේඛනයක දැන දැනම යම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් කරන; හෝ

(ආ) මේ පනත යටතේ තමා විසින් සැපයිය යුතු යම් තොරතුරක් හෝ වාර වාර්තාවක් සැපයීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන; හෝ

(ඇ) මේ පනතින් හෝ මේ පනත යටතේ යම් තැනැත්තකු වෙත පවරන ලද හෝ නියම කරන ලද යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් ඒ තැනැත්තා විසින් ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී ඔහුට බාධා කරන හෝ අවහිර කරන; හෝ

(ඈ) අධිකාරියේ සාමාජිකයකුව හෝ නිලධරයකුව නැතහොත් සේවකයකුව, මේ පනත යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී නැතහොත් ඒ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම

හා සම්බන්ධව, තමා විසින් ලබා ගන්නා ලද යම් තොරතුරක්, මේ පනත යටතේ වූ යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ හෝ යම් කාර්යයක් ඉටු කිරීමේ කාර්යය සඳහා ඒ තොරතුර අවශ්‍ය වන තැනැත්තකුට හැර වෙනත් තැනැත්තකුට ඒ තොරතුර හෙළිදරව් කරන ; හෝ

(ඉ) මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ මේ පනත යටතේ සාදන ලද රීතියක් හෝ කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ පනත යටතේ වරදක් සිදු කරන සෑම තැනැත්තකු ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

බදු හා රේගු බදුවලින් නිදහස් කිරීම.

28. මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් රේගු බදු හෝ සුරා බදු කිසිවක් ගෙවීමෙන් අධිකාරිය නිදහස් කරනු ලබන්නේ නම්, අධිකාරිය විසින් ආනයනය කරනු ලබන හෝ බන්ධිත ගුදමින් බාහිරව මිල දී ගනු ලබන භාණ්ඩ කිසිවක් සම්බන්ධයෙන් එකී රේගු බදු හෝ සුරා බදු ගෙවීමෙන් අධිකාරිය නිදහස් විය යුතු ය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිභවා බල පැවැත්විය යුතු බව.

29. වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර ඒ අනුව මේ පනතේ සහ ඒ වෙනත් නීතියේ විධිවිධාන අතර යම් ගැටීමක් හෝ අනනුකූලතාවක් ඇති වුවහොත් මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

## VI වන කොටස

## ඉවත් කිරීම සහ අන්තර් කාලීන විධිවිධාන

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 36 දරන පනත ඉවත් කිරීම.

30. ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 36 දරන ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභා පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

අන්තර් කාලීන විධිවිධාන.

31. නියමිත දිනයෙහි දී,—

(අ) සභාවේ සේවයෙහි යෙදී සිටි සියලුම නිලධරයන් හා සේවකයන් අධිකාරියේ සේවයෙහි යෙදී සිටින නිලධරයන් හා සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, හැකිතාක් දුරට, සභාවේ සේවයෙහි යෙදී සිටිය දී ඔවුන් දැරූ තත්ත්වයම ඇතිව සහ වේතන හෝ වැටුප්, සේවය අවසන් කිරීම, දීමනා හෝ වෙනත් ප්‍රතිලාභ හා සම්බන්ධ නියමයන් ද ඇතුළුව, සභාවේ සේවයෙහි යෙදී සිටිය දී ඔවුන්ට තිබූ හා ඔවුන් විසින් භුක්ති විඳින ලද නියම මත ඔවුන් ස්වකීය ධුර දැරිය යුතු ය ;

(ආ) සභාව විසින් ගන්නා ලද සියලු තීරණ අධිකාරිය විසින් ගන්නා ලද තීරණ ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) සභාව විසින්, සමග හෝ සඳහා, දරන ලද සියලු ණය, බැඳීම් හා වගකීම් ද ලියා අත්සන් කරන ලද හෝ ඇතුලත් වුණු සියලු ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම් සහ වෙනත් සාධන පත්‍ර ද ඉටු කිරීමට පොරොන්දු වූ සියලු කාරණා හා දේ ද අධිකාරිය විසින් අධිකාරිය සමග හෝ අධිකාරිය සඳහා දරන ලද ලෙස, ලියා අත්සන් කරන ලද ලෙස හෝ ඇතුලත් වූ ලෙස හෝ ඉටු කිරීමට පොරොන්දු වූ ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සභාව විසින් හෝ සභාවට විරුද්ධව හෝ පවරනු ලැබූ හෝ පවරනු ලැබිය හැකිව තිබූ හෝ සියලු සිවිල් නඩු, අපරාධ නඩු, අභියාචන නැතහොත් සිවිල් වූ හෝ අපරාධ වූ හෝ වෙනත් නඩු කටයුතු අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව හෝ, දිගටම පවත්වා ගෙන යනු ලැබිය යුතු ය; නැතහොත් පවරනු ලැබිය යුතු ය;

(ඉ) සභාවේ වාසියට හෝ සභාවට විරුද්ධව හෝ තිසි බලය ඇති අධිකරණයක් විසින් කරන ලද සියලු තීන්දු ප්‍රකාශ හෝ ආඥා, අධිකාරියේ වාසියට හෝ අධිකාරියට විරුද්ධව හෝ කරන ලද තීන්දු ප්‍රකාශ හෝ ආඥා ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඊ) සභාව වෙත සතු කරන ලද හෝ, සභාව විසින් නීත්‍යානුකූලව මිලට ගන්නා ලද නැතහොත් අත්කර ගන්නා ලද හෝ සභාවට බදු දෙන ලද හෝ, සභාවේ පරිහරණය සඳහා දෙනු ලැබූ හෝ වෙනත් කවර හෝ ආකාරයකින් සභාව වෙත පවරන ලද හෝ සභාව සන්තකයෙහි හෝ එහි පාලනය යටතේ ඇති චංචල හෝ නිශ්චල සියලු දේපළ, ඒ දේපළවලට සම්බන්ධ හෝ අනුයුක්ත හෝ අදාළ භාර, අය කිරීම්, වගකීම්, සීමා කිරීම්, පරවශතා හෝ වෙනත් බැඳීම්වලට යටත්ව සහ ඒ දේපළවලට සම්බන්ධ හෝ අනුයුක්ත හෝ අදාළ නියම හා කොන්දේසි මත, අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් භාරයක් වශයෙන් හෝ දරනු ලැබිය යුතු ය;

(උ) සභාව විසින් සාදන ලද සියලු රීති අධිකාරිය විසින් සාදන ලද රීති ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඌ) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 36 දරන ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභා පනතේ 22 වන වගන්තිය යටතේ පිහිටුවන ලද, සභාවේ අරමුදල අධිකාරියේ අරමුදල ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**32.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"සභාව" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 36 දරන ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභා පනත යටතේ පිහිටුවන ලද සභාව අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් කිසි නීතියකින් හෝ නීතියක් යටතේ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම් කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නාවූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මූළු අරමුදල හෝ මූළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් සපයනු ලබන්නාවූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය